මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම 2024

ප්‍රායෝගික තාක්ෂණික කුසලතා

Learning Resource Centre
R
De Mazenod College
Kandana

විභාග අංකය:......................................... 9 වසර

නම:.................................................. කාලය පැය 02

2024-08

## 1 හා 2 කොටස

සැලකිය යුතුයි :

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 15 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

## 1 කොටස

1)එළවළු වර්ග බෙදා දැක්විය හැකි වඩාත් නිවැරදි පිළිතුරු කාණ්ඩය වනුයේ?

(i) දකුණු එළවළු, උතුරු එළවළු (ii) යාපනයේ එළවළු, නුවරඑළිය එළවළු

(iii) උඩරට එළවළු, පහතරට එළවළු (iv) රට එළවළු, ලංකා එළවළු

2)පැල වැඩීමට ඉඩහැර සති 2ක4 අතර කාලයක් ගියපසු බීජ පත්‍ර සහිත ලපටි කඳ ආහාරයට ගනී. මෙය හඳුන්වනු ලබන්නේ?

(i) අංකුර (ii) ක්ෂුද්‍ර පලා (iii) සිරප්වල දැමූ එළවළු (iv) විසිතුරු පත්‍රික ශාක

3)සෘජුවම භාවිතා කල හැකි පරිදි බෝග වගාව හා සත්ව පාලනය මගින් ලබාගන්නා විවිධ නිශ්පාදන හඳුන්වනු ලබන්නේ?

(i) බෝග අස්වනු (ii) කෘෂි සේවා (iii) තිරසාර ගෙවත්තක් (iv) කෘෂි නිශ්පාදන

4)පිරිවැය ප්‍රතිලාභ යටතට අදාල නොවන්නේ.

(i) මූලික යෙදුම් (ii) ආදායම් (iii) නඩත්තු වියදම් (iv) ව්‍යාපාර

5)නිවස අභ්‍යන්තරයේ බිත්තිවල එල්ලා තැබිය හැකි වගා ආශ්‍රිත නිර්මාණය වන්නේ,

(i) ක්ෂුද්‍ර රූපී උද්‍යාන (ii) සජීවී බිත්ති සැරසිලි (iii) වගා බිම් (iv) පෙරමෝන උගුල

6)චතුර්පියන් බද්දයක් සිදුකිරීමට මූලිකවම අවශ්‍ය වන ද්‍රව්‍යක් වන්නේ.

(i) කොහුබත් පෝච්චිය (ii) වගා ඉනිමගක් (iii) ග්‍රහකය (iv) මල් කතුර

7)බඩගමුව රක්ෂිත වනය පිහිටා ඇති දිස්ත්‍රික්කය වන්නේ,

(i) කුරුණෑගල (ii) මහනුවර (iii) ගම්පහ (iv) කෑගල්ල

8) සරළ පෙරනයක් සැදීමේ දී මුඩිය සඳහා යොදා ගැනීමට වඩාත් සුදුසු වන්නේ.

(i) සියුම් වැලි (ii) කපු රෙදි කැබැල්ල (iii) අඟුරු (iv) රළු වැලි

9)ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානයට අදාල නිවැරදි සලකුණ වන්නේ.

(i) SLS (ii) ISO (iii) R3 (iv) 5S

10)පුද්ගල සනීපාරක්ෂාව සඳහා යොදා ගන්නා ආරක්ෂිත ඇඳුම් කට්ටලයකදී පාද සඳහා භාවිතා කරනු ලබන්නේ.

(i) අත් වැසුම් (ii) පා වැසුම් (iii) මුඛ ආවරණ (iv) කබාය

11) දකුණු පලාතේ බහුලව පවතින ආහාර වර්ගයක් නොවන්නේ.

(i)මී කිරි (ii) මාළු (iii) පහතරට එළවළු (iv) ස්ට්‍රෝබෙරි

12) දිවෙහි රසාංකුර සඳහා සංවේදී නොවන රස වර්ගයක් නොවන්නේ.

(i) තිත්ත රස (ii) ඇඹුල් රස (iii) සුවඳ විලවුන් රස (iv) ලුණු රස

13) සූත්‍රිකා පහන් වල කාර්යක්ෂමතාවට වඩා ඉහල අගයක් ගනු ලබන්නේ.

(i) LED පහන් (ii) මැටි පහන් (iii) ඉටි පහන් (iv) ප්‍රතිදීප්ත පහන්

14) බයිසිකලයක ඝර්ෂණය අවම කිරීම සඳහා භාවිතා කරනු ලබන්නේ.

(i) ලාම්පු තෙල් (ii) පියරු (iii) ස්නේහක (iv) වතුර

15) මුගුණු වැන්න අස්වැන්නක් ලබා ගැනීමට මුගුණුවැන්න ඉත්තක් දඬු වර්ග කීයකට වෙන් කර ගත් හැකිද?

(i)දඬු වර්ග 2 (ii)දඬු වර්ග 4 (iii)දඬු වර්ග 3 (iv)දඬු වර්ග 5

---

## 02 කොටස

- 1වන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(1) වරහන තුලින් තෝරා වඩාත් නිවැරදි පිළිතුර හිස් තැනෙහි ලියන්න.

i) අධික රසායනික පොහොර භාවිතය නිසා........................................................................ සිදුවේ.

ii) පරිසරයට හානි නොවන කෘෂි උපක්‍රමය..................................................................වේ.

iii) වනාන්තර එළිකිරීමෙන්................................................................................ වේ.

iv) පසෙහි ගුණාංග වලට හානි සිදුවීම..................................................................... වේ.

v) නයිට්‍රජන් එක්රැස්වීම.................................................................................වේ.

**(පාංශු ඛාදනය /ජලය සුපෝෂණය වීම /වකුගඩු රෝගීන් වැඩිවීම/ හරිත තාක්ෂණික ක්‍රමය/ පාංශු හායනය)**

(2)

I) ආකර්ෂණීය හා විසිතුරු ලෙස පැල වගා කිරීමේදී කෘෂි සේවා ලබා ගැනීමට හේතු දෙකක් නම් කරන්න.

II) ඉඩකඩ සීමා වූ විට භාවිත කල හැකි විකල්ප වගා ක්‍රම දෙකක් නම් කරන්න.

iii) ඉහල මිලක් ලබාගත හැකි කෘෂි සේවාවන් දෙකක් නම් කරන්න.

iv) තිරසාර ගෙවත්තකින් නිවැසියන්ට ලැබෙන ප්‍රධාන වාසි දෙකක් ලියන්න.

v) කෘෂි නිශ්පාදන දෙකක් නම් කරන්න.

(3)

i) ව්‍යාපෘතියක පියවර හතරක් ලියන්න.

ii) පාසලක ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සුදුසු යෝජනාවක් ඉදිරිපත් කරන්න.

iii) කාලානුරූපීව වර්ධනය වූ සේවා දෙකක් ලියන්න.

iv) පාසල සම්බන්ධව ව්‍යාපෘතියක් තෝරා ගැනීමේදී මතු වන ගැටලු තත්ව සඳහා උදාහරණ හතරක් ලියන්න.

(4)

i) ශ්‍රී ලංකාවේ භාවිතා වන ආහාර ප්‍රමිති සහතික දෙකක් ලියන්න.

ii) GMP කෙටි නාමයෙන් අදහස් කරන්නේ කුමක්ද?

iii) ආහාර ආශ්‍රිත කර්මාන්ත වලට බලපාන සාධක දෙකක් ලියන්න.

iv) නිෂ්පාදනයක් මිලදී ගැනීමේදි සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

v) ආහාරයක සෞඛ්‍ය ආරක්ශිතබව නොමැති අවස්ථා දෙකක් ලියන්න.

(5) කෙටි සටහන් ලියන්න.

i) උත්තේජනය

ii) වයනය

iii) පෝෂක සංඝටක

iv) වර්ණ

(6)

I) අතීතයේ ජලය ලබාගත් ක්‍රම දෙකක් ලියන්න.

ii) අතීතයේ ආලෝකය ලබාගත් ක්‍රම දෙකක් ලියන්න.

iii) අතීතයේ ගමනා ගමනය කල ආකර දෙකක් ලියන්න.

Iv) අතීතයේ භාවිතා කල ඉන්ධන වර්ග දෙකක් ලියන්න .

v) අතීතයේ භාවිතා කල සන්නිවේදන ක්‍රම දෙකක් ලියන්න.

| | |
|---|---|
| ප්‍රයෝගික පරීක්ෂණයේ ලකුණු | ...... |
| ලිඛිත පරීක්ශනයේ ලකුණු | ...... |
| මුලු ලකුණු | ...... |